සකස් කළ ඇඳුම්, ඛනිජ තෙල් නිෂ්පාදිත, පිගන් භාණ්ඩ සහ ටින් කළ පළතුරු අපනයනයන්හි සැලකියයුතු වැඩිවීමක් ඇති විය. 1975 දී කාර්මික අපනයනයන්හි වටිනාකම මුළු කාර්මික නිෂ්පාදන වටිනාකමින් සියයට 9 ක් වුවද, 1976 දී එය සියයට 12 ක් විය.

1976 දී ප්‍රධාන වශයෙන්ම නිෂ්පාදනය වැඩිවූයේ පිළිවෙළින් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) සකස් කළ ලෝහ භාණ්ඩ නිෂ්පාදනය, යන්ත්‍ර සහ ගමනාගමන උපකරණ නිෂ්පාදනය, ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය සහ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය යන අංශයන්හිය.

වැඩිම වර්ධනයක් ඇතිවී තිබෙන්නේ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) අංශයෙහිය. පිගන් භාණ්ඩ, සිමෙන්ති, ගඩොල් සහ උළු නිෂ්පාදනය වැඩිවීම නිසා මෙම අංශයෙහි මුළු නිමැවුම වැඩිවිය. විවිධ කාර්මික අංශයන් අතර මෙම අංශය සඳහා ඉතා අඩුවෙන් ආනයනය කළ අමුද්‍රව්‍ය යොද ගැනීම වැදගත් කරුණකි. තවත් සැලකියයුතු කරුණක් නම් මෙම අංශයෙහි ශ්‍රමය යොද ගැනීම ඉතා අධික වීමය. මෙම අංශයෙහි එකතු වූ වටිනාකම වැඩිවීම සියයට 45 ක් වූ අතර එය 1976 වාර්තා වූ ඉහළම එකතුවූ වටිනාකම් අතරට වැටේ.

කාර්මික නිෂ්පාදනය පාරිභෝගික සහ අන්තර් භාණ්ඩ නිෂ්පාදනයෙහි සංකේන්ද්‍රණය වී ඇති අතර මුළු නිෂ්පාදන වටිනාකමින් සියයට 90 ක් මෙම අංශයෙහි අඩංගු වේ. මෙම කොටසෙහි ඇතුළත් ආහාර, බීම සහ දුම්කොළ, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් හා ගල් අඟුරු, රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ යන අංශයන් මුළු කාර්මික නිෂ්පාදනයේ වටිනාකමින් සියයට 80 ක් තරම් ඉහළ අගයක් වාර්තා කර තිබේ.

මෙම අංශයන් අතර, උප අංශයන් වූ ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනයේ වටිනාකම අධික ලෙස වැඩිවී තිබේ. කිරි සහ කිරි නිෂ්පාදන, තිරිඟු පිටි සහ සීනි නිෂ්පාදනය විශාල ලෙස වැඩි වූ අතර සිගරැට් නිෂ්පාදනය සුළු වශයෙන් අඩු විය. ඛනිජ තෙල් නිෂ්පාදනයේද සුළු වැඩිවීමක් වාර්තා වී තිබේ.

සකස් කළ ඇඳුම් අපනයනයේ තියුණු වැඩිවීමක් තිබුණද රෙදිපිළි නිෂ්පාදනයේ සැලක්ය යුතු පහත වැටීමක් වාර්තා වේ. උදහරණයක් වශයෙන් ජාතික පේෂකර්ම සංස්ථාවේ සියලු නිෂ්පාදන ඒකක වල නිෂ්පාදන සියයට 15 කින් අඩුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රෙදිපිළි ආනයන වටිනාකම සියයට 100 ටත් වැඩියෙන් ඉහළ නැගිණි.

කඩදසි සහ කඩදසි භාණ්ඩ නිෂ්පාදනයෙහිදී තියුණු පහත වැටීමක් ඇතිවිය. මෙයට හේතු වූයේ වර්ෂයේ කාලයක් තුල පැවති නියඟ නිසා කඩදසි නිෂ්පාදනයට අවශ්‍ය ජලය සෑහෙන පරිදි නොලැබීමත් කඩදසි භාණ්ඩ නිපදවීම සඳහා අවශ්‍ය ආනයනය කරන ලද කඩදසි සෑහෙණ පමණ නොලැබීමත්ය.

1976 කාර්මික අංශයෙහි ඇති වූ වැදගත් සිදුවීමක් නම් යූරියා පෝර නිපදවීමේ කර්මාන්ත ශාලාවක් සඳහා ගිවිසුම් අත්සන් කිරීමයි. මේ සඳහා මුළු ප්‍රාග්ධන වියදම රුපියල් 120 කෝටියක් වන අතර එහි වාර්ෂික නිෂ්පාදන ධාරිතාවය ටොන් 3,10,000 කි.

මිල සහ වැටුප්

මිල

ආර්ථිකයේ සාමාන්‍ය මිල මට්ටමෙහි වෙනස් වීම් පෙන්නුම් කිරීම සඳහා දැනට ඇති එකම දර්ශකය වූ, කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය, 1976 දී සියයට 1·2 කින් ඉහළ ගියේය. 1975 දී මෙම දර්ශකය සියයට 6·7 කින් වැඩි වූ අතර, 1974 දී සියයට 12·3 කින් වැඩිවී තිබුණි. කෙසේ හෝ ගම්‍ය මිල දර්ශකයට[1] අනුව, මෙම වර්ෂය තුළදී මිල ගණන්වල වැඩිවීම සියයට 6·6 ක් හැටියට ගණන් බලා ඇත.

1. ගම්‍ය මිල දර්ශකය යනු; පවත්නා මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය සහ (1959) ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය අතර අනුපාතයයි.

22469
21 APR 20

මෙම වර්ෂය තුළදී කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය සියයඹ 1·2 කින් වැඩිවීම, ආහාර පිළිබඳ මිල සියයට 1·1 ක ප්‍රමාණයකින් අඩුවීමත්, රෙදිපිළි මිල ගණන් සියයට 1·7 කින් ද, ඉන්ධන හා එළිය පිළිබඳ මිල සියයට 11·9 කින් ද, අනෙකුත් වර්ගයන්හි මිල ගණන් සියයට 6·2 කින් ද, වැඩිවීමත් තුළින් ඇතිවූ ප්‍රතිඵලයකි. පිටි මිල රාත්තලක් රුපියලකුත් ශත 10 සිට ශත 80 දක්වාත්, පාන් මිල රාත්තලක් ශත 98 සිට ශත 75 දක්වාත් අඩු කෙරුණි. ඒ සමගම පුද්ගලයකු ලබන මාසික සීනි සලාකය රාත්තල් තුන්කාලක සිට රාත්තලක් දක්වා වැඩිකිරීමත්, එය රාත්තලක් ශත 72 ක් වූ සහනාධාර මිලකට සැපයීමත් නිසා අනිකුත් ආහාර ද්‍රව්‍යයන්හි මිල ගණන් වැඩිවීම බෙහෙවින්ම සමහන් විය. ඉන්ධන හා එළිය පිළිබඳ දර්ශකය බෙහෙවින් ඉහළ ගිය අතර, එයට මූලික හේතුව වූයේ, දරවල මිල ගණන් වැඩිවීමයි. විවිධ භාණ්ඩ ගණයෙහි මිල ගණන් වැඩිවීමට තුඩු දුන්නේ දුම්කොළ බදු, හා සුරා බදු ඉහළ නැංවීමට කළ සංශෝධනයන් ය.

එදිනෙදා ප්‍රයෝජනයට ගනු ලබන පාරිභෝගික භාණ්ඩයන්හි මිල ගණන් අඩුකරලීම සඳහා රජය ගත් පියවර අතර සලාක කිරීම් සහ මිල පාලනයත් තවදුරටත් වැදගත් විය. මෙම වර්ෂය තුළදී ජාතික කිරි මණ්ඩලයේ නිෂ්පාදිතයන් වැනි ආහාර ද්‍රව්‍යයන් ද, මෝටර් රථ අමතර කොටස් ද, ඇතුළු භාණ්ඩ ගණයන් 26 ක් පළමු වතාවට මිල පාලනය යටතට ගෙනෙන ලදී. කෙසේ හෝ පාලනය කළ මිල ගණන් වලින් නිෂ්පාදකයනට උචිත ලාබදායි බවක් නොලැබීම හේතුවෙන් සැපයුමේ සීමාවීමක් දක්නට ලැබුණ අවස්ථාවලදී එම මිල ගණන් යළි සංශෝධනය කෙරිණි.

වැටුප්

මෑත කාලයේදී වැඩිවූ මිල ගණන් නිසා හටගත් දුෂ්කරතාවලට සහනයක් සැලසීම සඳහා රාජ්‍ය අංශයේ සේවකයන්ගේ සහ වැටුප් පාලක සභා යටතට ගැනෙන සේවකයන්ගේ වැටුප් හා වේතන රජය මගින් සංශෝධනය කරන ලදී. රජයේ අයවැය යෝජනාවනට අනුව රජයේ සේවකයන් සඳහා වූ විශේෂ දීමනාව 1976 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි මසකට රුපියල් 15 කින් වැඩි කරන ලදී. මෙම වැඩිවීම ඉන්පසුව රජයේ ගුරුවරුනටද, අර්ධ රාජ්‍ය අංශයේ (රජයේ සංස්ථාවන්, විශ්ව විද්‍යාල, පර්යේෂණ ආයතන හා ව්‍යවස්ථාපිත මණ්ඩල යනාදී) සේවකයන්ට සහ වැටුප් පාලක සභා යටතට ගැනෙන සේවකයනටද දීමට තීරණය කරන ලදී. වැවිලි අංශයේ ශ්‍රමිකයන්ගේ වැටුප් සම්බන්ධයෙන්ද ඔවුන්ගේ දෛනික වැටුප් අනුපාතිකය, රැකියාවේ ස්වභාවය හා වැඩ කළ දින ගණන අනුව සමානුපාතික ඉහළ නැංවීමකට අවසර දෙන ලදී. පුද්ගලයන් 25 කට වඩා අඩුවෙන් සේවයේ යොදවා ඇති කුඩා පෞද්ගලික ආයතන හා පිළිගත් පුණ්‍යායතන හැර සෙසු පෞද්ගලික අංශයේ සේවකයනටද, ජීවන වියදම් දර්ශකයේ වෙනස්වීමට අනුව ජීවන වියදම් පාරිතෝෂිකය නොගෙවන අවස්ථාවලදී මෙම අතිරේක දීමනාව ගෙවීමට නීති මගින් නියම කෙරිණි.

රජයේ සේවකයන්ගේ (රජයේ පාසැල් ගුරුවරුන්ගේ හැර) අවම වැටුප් අනුපාතිකය 1976 දී සියයට 5·8 කින් වැඩි විය. රාජ්‍ය අංශයේ සුළු සේවකයන්ගේ අවම වැටුප් සියයට 6 5 කින් වැඩිවූ අතර, ශිල්පීය හා ලිපිකරු ශ්‍රේණිවල සේවකයන්කේ අවම වැටුප් සියයට 4·8 කින් වැඩිවුණි. රජයේ පාසැල් ගුරුවරුන්ගේ අවම වැටුප් ද සියයට 5·7 කින් වැඩිවී තිබුණි. එහෙත් පුද්ගලික අංශයේ වැටුප්වල සියයට වැඩිවීම ඊට වඩා අඩු මට්ටමකින් සිදුවුණි. වැවිලි අංශයේ කම්කරුවන්ගේ මුදල්මය වැටුප් සියයට 2·16 කින් ඉහළ ගිය අතර, කර්මාන්ත සහ වාණිජ අංශය තුළ කම්කරු වැටුප් සියයට 2·68 කින් වැඩිවුණි. කෙසේ වුවද, යෝග්‍ය පාරිභෝගික මිල දර්ශකයක් නොමැතිකම නිසා මෙම වර්ෂය තුළදී මූර්ත වැටුප්වල වෙනස්කම් තක්සේරු කිරීම අපහසු ය. ඒ වෙනුවට, ගම්‍ය මිල දර්ශකය උචිත දර්ශකයක් ලෙස පිළිගතහොත්, 1976 වර්ෂයේදී මූර්ත වැටුප් අනුපාතිකයන් බෙහෙවින් අඩුවී ඇති බව පෙනේ.